# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 376/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 03/03/2024<br>පැය 0950 |

## මාධ්‍ය නිවේදනය

**පුද්ගලයින් 30 දෙනෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධව - කාත්තන්කුඩි පොලිස් ස්ථානය.**

2024.03.01 වන දින අළුයම් කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ පාලමුණෙ ආරියම්පති ප්‍රදේශයේ තාවකාලිකව ඉදිකල මඩුවක් වැනි ස්ථානයක පුද්ගලයින් 30ක පමණ පිරිසක් රැස්ව සිටින බවට කාත්තන්කුඩි පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත එම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එහි සිටි පුද්ගලයින් 30 දෙනෙකු යම් අපරාධ ක්‍රියාවක් හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාවක් සිදු කිරීමේ අරමුණින් රැස්ව සිටින බවට වූ සැකය මත අත්අඩංගුවට ගෙන තිබුණි.

සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයින් 30 දෙනෙකුගෙන් කාත්තන්කුඩි පොලිස් ස්ථානය මගින් ප්‍රකාශ සටහන් කර ගෙන තිබූ අතර එම පුද්ගලයින්ගෙන් මඩකලපුව ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාස ඒකකයේ නිලධාරීන් විසින්ද ප්‍රශ්න කිරීම් සිදුකර තිබුණි.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 24ත් 48ත් අතර වයස්වල පසුවන කාත්තන්කුඩි හා මඩකළපුව ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් අතර පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සහරාන් හෂීම්ගේ නැගණියගේ ස්වාමිපුරුෂයා හා ඔහුගේ වැඩිමහල් සොහොයුරන් දෙදෙනෙකුද සිට ඇත. එම සැකකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් සිදුකල විමර්ශන වලට අනුව මෙම පිරිස යම් අපරාධයකට හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාවක් සිදුකිරීමේ ඇරමුණින් රැස්ව සිටි බවට තොරතුරු අනාවරණය වී නොමැත.

ඉහත සැකකරුවන් මඩකළපුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අතර එම පුද්ගලයින් රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප මත මුදා හැර 2024.03.06 වන දින නැවත ගරු අධිකරණය වෙත පෙනී සිටින ලෙසට නියෝග කර ඇත. මොවුන් සම්බන්ධව කාත්තන්කුඩි පොලිසිය හා ත්‍රස්ත මර්ධන හා විමර්ශන විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**